**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහා (SL-01-2016)**

**02 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2024**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහා (SL-01-2016) 02 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ඉදිරියේදී පැවැත්වීමට සැලසුම් කර ඇත.

**1. විභාග පරිපාටිය**

1.1 02 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහා (SL-01-2016)

1.1.1. විභාගය පිළිබඳ විස්තරය:

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති | පැය 03 | 100 | 40% |
| සංවර්ධන පරිපාලන පිළිබඳ ක්‍රියාවලිය | පැය 03 | 100 | 40% |
| කළමනාකරණය හා සංවිධාන ක්‍රම | පැය 03 | 100 | 40% |
| රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය | පැය 03 | 100 | 40% |

1.1.2. විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය |
|---|---|---|
| 01. ආර්ථික හා සමාජ ප්‍රතිපත්තිය | ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා බලපාන කරුණු මත පදනම් වූ ප්‍රශ්න පත්‍රයකි. ශ්‍රී ලංකාවේ මෑත කාලීන ආර්ථික, සමාජ හා දේශපාලන ඉතිහාසයෙහි තුළ ආර්ථික විද්‍යා මූලධර්මයන් උපයෝගී කරගත් ආකාරය | පැය 03 |
| 02. සංවර්ධන පරිපාලන ක්‍රියාවලිය | පහත කරුණු පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරමින් සංවර්ධනය පරිපාලනය භාර වූ ආයතන, ඒවායේ ක්‍රියාකාරීත්වය හා අන්තර් සම්බන්ධතාවයන් මත පදනම් වූ ප්‍රශ්න පත්‍රයකි.<br>(අ) ශ්‍රී ලංකාවේ රාජ්‍ය තන්ත්‍රය<br>(ආ) ශ්‍රී ලංකාවේ රාජ්‍ය තන්ත්‍රයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පසුබිම<br>(ඇ) පළාත් සභා හා පළාත් පාලන<br>(ඈ) මහජන සංවිධාන<br>(ඉ) රාජ්‍ය සංස්ථා | පැය 03 |
| 03. කළමනාකරණය හා සංවිධාන ක්‍රම | (අ) කළමනාකරණය හා සංවිධානය පිළිබඳ මූලධර්ම<br>(ආ) එම මූලධර්ම රාජ්‍ය අංශයේ පැනනගින ගැටළු හා ප්‍රශ්න වලට අදාළ කර ගැනීම<br>(ඇ) කළමනාකරණය පිළිබඳ නූතන ක්‍රමවේදයන් හා ශිල්ප ක්‍රම | පැය 03 |

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය |
|---|---|---|
| 04. රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය | පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයකි.<br>(අ) - ශ්‍රී ලංකාවේ මූල්‍ය පාලනය<br>-රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාල ව්‍යවස්ථාමය විධිවිධාන<br>- රාජ්‍ය මූල්‍ය සම්බන්ධ පාර්ලිමේන්තුවේ පාලනය<br>- අරමුදල් යන්නෙහි අර්ථය<br>- ඒකාබද්ධ අරමුදල සහ එහි ක්‍රියාකාරීත්වය<br>- විසර්ජනයේ අරමුණු සහ විසර්ජන ක්‍රම<br>- අවිනිශ්චිත අවස්ථා අරමුදල<br>- වෙනත් අරමුදල් හා ඒවායේ ක්‍රියාකාරීත්වය<br>- රාජ්‍ය ආදායම<br>- මුදල් ඇමතිවරයාගේ බලතල හා කාර්ය භාරය<br>- භාණ්ඩාගාරයේ බලතල හා කාර්ය භාරය<br>- වොරන්ට් සහ අග්‍රිම අධිකාරිය<br>- ගණකාධිපති, ඔහුගේ බලතල හා කාර්ය භාරය<br>- රාජ්‍ය වියදම් කමිටුව<br>- රාජ්‍ය ව්‍යාපාර කමිටුව<br><br>(ආ) ගිණුම් නිලධාරීන්, ප්‍රධාන ගිණුම් නිලධාරීන් හා රාජ්‍ය ආදායම පිළිබඳ ගිණුම් නිලධාරීන් පත් කිරීම, ඔවුන්ගේ බලතල හා කාර්යභාරය<br>(ඇ) අභ්‍යන්තර විගණනය<br>(ඇ) රාජ්‍ය වියදම් සැලසුම් කිරීම හා කළමනාකරණය<br>සංවිධානවල අරමුණු හා කාර්යභාරයයන් හඳුනාගැනීම.<br>රාජ්‍ය ප්‍රතිපත්ති, පරමාර්ථ ඉලක්ක හා වැඩසටහන් හඳුනා ගැනීම.<br>සංවර්ධන ව්‍යාපෘති, වැඩසටහන් සැළසුම් කිරීම හා ඇගයීම හා ප්‍රමුඛතාකරණය, වාර්ෂික ආදායම් හා වියදම් ඇස්තමේන්තු සැකසීම හා අවසන් තීරණ ගැනීම.<br>(ඉ) අනුමත වියදම් ඇස්තමේන්තුවල වෙනස්කම් කිරීම.<br>විරමෝං පරිපාටිය ක්‍රියාත්මක කිරීම.<br>රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා හා වැටුප් කළමනාකරණය<br>මුළු පිරිවැය ඇස්තමේන්තු හා ඒවා ප්‍රතිශෝධන කිරීම<br>පරිපූරක ඇස්තමේන්තු<br>(ඊ) රජයේ දේපලවල හානි හා පාඩු<br>(උ) විවිධ ගිණුම් කටයුතු<br>(ඌ) මූල්‍ය කළමනාකරණය සඳහා කාර්ය භාරයන් පැවරීම<br>(එ) රජයේ මුදල්වල භාරකාරත්වය හා බැංකු ගිණුම් පරිපාටිය<br>(ඒ) රජයේ සැපයුම් ක්‍රියාපරිපාටිය<br>භාණ්ඩ සේවා හා වැඩ ලබා ගැනීම<br>ටෙන්ඩර් මණ්ඩල හා තාක්ෂණ ඇගයුම් කමිටුවල සංයුතිය<br>පත් කිරීම් බලතල හා කාර්ය භාරය<br>ටෙන්ඩර් ඇගයීමේ ක්‍රියාපරිපාටිය<br>විදේශ ආධාර මත ක්‍රියාත්මක ව්‍යාපෘතිවල කළමනාකරණය | පැය 03 |

**2. අයදුම්පත් ඉදිරිපත් කිරීම:**

මෙම පරීක්ෂණයට පෙනී සිටීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූලව A4 කඩදාසියක දෙපැත්තම පාවිච්චි කරමින් අංක 01 සිට 05 දක්වා ඡේද එක් පිටුවකටත්, ඉතිරි කොටස අනෙක් පිටුවටත් වන සේ සකසා ගත් අයදුම්පත් අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශය සහිතව **2024.10.16 දින හෝ ඊට ප්‍රථම අධ්‍යක්ෂ ජනරාල් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව** වෙත ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ **"සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහා (SL-01-2016) 02 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය"** යනුවෙන් සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. **විභාග ගාස්තු**

අසමත් විෂයන් සඳහා විභාගයට නැවත පෙනී සිටීමේදී එක් විෂයයකට රුපියල් දෙසිය පනහක් (රු.250/=) බැගින් විභාග ගාස්තු ලෙස ඔබ සේවය කරනු ලබන දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් කාර්යාලයට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට 2003-02-99 ට බැර වනසේ ගෙවා එම කුවිතාන්සියේ පිටපතක් අයදුම්පත්‍රයේ අදාළ කොටසෙහි නොගැලවනසේ ඇලවිය යුතුය.

5. **විභාගයට පෙනී සිටීමට සුදුසුකම්:**

මෙම නිවේදනය සැලකිල්ලෙන් කියවා ඉල්ලා ඇති සියලුම තොරතුරු සම්පූර්ණ කර, අයදුම්පත් දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවය අයදුම්පත් වෙතොත් ඒවා ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත.

6. **විභාගයට ඇතුළත් කර ගැනීම හා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම:**

අයදුම්පත් ඉදිරිපත් කර ඇති සුදුසුකම් සපුරා තිබෙන සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර හා කාලසටහන් ජාතික අධ්‍යාපන ආයතනය මගින් නිකුත් කරනු ඇත.

7. **විභාගයට පෙනී සිටීම සඳහා පැමිණීම වෙනුවෙන් ගමන් වියදම්, සංයුක්ත දීමනා හෝ උපවේශන දීමනා කිසිවක් ගෙවනු නොලැබේ.**

ආර්.ඩී.පී.වෙඩික්කාර,
අධ්‍යක්ෂ (පාලන),
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ශ්‍රේණිය සඳහා (SL-01-2016)**

**02 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2024**

01. 1.1 අයදුම්කරුගේ මුලකුරු සමඟ නම : (සිංහලෙන්) ..........................................................................

..........................................................................

1.2 අයදුම්කරුගේ මුලකුරු සමඟ නම : (ඉංග්‍රීසියෙන්) ..........................................................................

..........................................................................

1.3 සම්පූර්ණ නම : (සිංහලෙන්) ..........................................................................

..........................................................................

1.4 සම්පූර්ණ නම : (ඉංග්‍රීසියෙන්) ..........................................................................

..........................................................................

02. 2.1 තනතුර : ..........................................................................

03. 3.1 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය : (සිංහලෙන්) ..........................................................................

..........................................................................

3.2 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය : (ඉංග්‍රීසියෙන්) ..........................................................................

..........................................................................

3.3 රාජකාරි ස්ථානය හා එහි ලිපිනය : ..........................................................................

..........................................................................

3.4 දුරකථන අංකය :

රාජකාරි: | | | | | | | | | | |  පෞද්ගලික: | | | | | | | | | | |

04. 4.1 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

4.2 උපන් දිනය: | | | | | | | | | |

4.3 ස්ත්‍රී පුරුෂ භාවය: [ ]

05. 5.1 විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : [ ]

5.2 පෙනී සිටීමට බලාපොරොත්තු වන විභාගය : [ ]

5.3 පෙනී සිටීමට බලාපොරොත්තු වන විෂයය / විෂයයන්:

| | |
|---|---|
| | |
| | |
| | |
| | |

06. අයදුම්කරුගේ ප්‍රකාශය:

(අ) මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

(ආ) මෙම විභාගයට අදාළ සියළුම කොන්දේසි පිළිපැදීමට මම එකඟ වෙමි.

දිනය අයදුම්කරුගේ අත්සන

07. කාර්යාල / අංශ ප්‍රධානියාගේ නිර්දේශය:

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ඉහත අත්සන යෙදූ නිලධාරියා / නිලධාරිණිය මෙම කාර්යාලයේ / අංශයේ සේවය කරන බව සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්/අධ්‍යක්ෂ

(නිල මුද්‍රාව තබන්න)

08. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

(i) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්,

(ii) අපේක්ෂකයා / අපේක්ෂිකාව මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

දිනය අධ්‍යක්ෂ ජනරාල් /අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

| |
|---|
| **මුදල් ගෙවන ලද කුවිතාන්සිය මෙහි අලවන්න** |